**පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ එන්සීපී/8/2010(i)**

මගේ අංකය: එන්සීපී/සීඑස්/පීටී/බී/1/10/(2011)
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරුමැද පළාත, අනුරාධපුරය.
2010 මැයි මස 13 දින.

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් සභාවේ ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>ආදායම් සහ වියදම් ඇස්තමේන්තු - 2011</u>**

ඉහත කරුණ පිළිබඳ මාගේ සමාංක හා 2010 මාර්තු මස 02 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ එන්සීපී/8/2010 හි විධි විධාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛයේ 09 වන ඡේදයේ විධි විධාන අනුව මූලධන වියදම් ඇස්තමේන්තු සැකසීම සඳහා එම චක්‍රලේඛය සමග එවන ලද **<u>'ඒ' ආකෘතිය</u>** භාවිතා කළයුතු බව සඳහන් වේ. එම ආකෘති පත්‍රය මුදල් කොමිෂන් සභාව විසින් සංශෝධනය කර නව **<u>'ඒ' ආකෘති</u>** පත්‍රයක් හඳුන්වාදී ඇත. එම නව **<u>'ඒ' ආකෘති</u>** පත්‍රය මේ සමග එවන අතර, ඔබගේ වැය ශීර්ෂයට අදාල මූලධන වියදම් ඇස්තමේන්තු එම නව **<u>'ඒ' ආකෘති</u>** පත්‍රයට අනුව සකස් කර 2010 මැයි මස 24 වන දිනට පෙර මාවෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි. එමෙන්ම ඇස්තමේන්තු පිටපතක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන්ද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

ඒ.තලාකොටුනගේ ,
ප්‍රධාන ලේකම්,
උතුරුමැද පළාත.